# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.26 පැය 0715 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1887/2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**රථවාහන රාජකාරි නිරත නිලධාරීන් රාත්‍රී කාලයේ රථවාහන නැවැත්වීමේදී ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධව - පොලිස් මූලස්ථානය.**

රථවාහන රාජකාරි නිලධාරීන් රාත්‍රී කාලයේ රථවාහන නැවැත්වීමට සංඥා කිරීමේදී බොහෝ අවස්ථාවල විවිධ ආකාරයේ විදුලි පන්දම් භාවිතා කිරීම තුලින් එම විදුලි පන්දම් ආලෝකය රියදුරන්ගේ මුහුණට වැදීම හේතුවෙන්, ඇතැම් අවස්ථාවල රථය හැසිරවීමට සහ පාලනය කිරීමට ඇති වන අපහසුතාවය මෙන්ම එමඟින් අනතුරු සිදුවීමට ඇති හැකියාවත්, ආලෝක පරාවර්තන ජැකට් පැළඳ නොසිටීම තුලින් නිලධාරින් අනතුරට පත් වීමේ අවකාශය වැඩි බවටත් නිරීක්ෂණය වී ඇත.

ඒ අනුව මින් ඉදිරියට රථවාහන රාජකාරි යෙදී සිටින නිලධාරින් මින් පෙර උපදෙස් ලබාදී ඇති පරිදි රාත්‍රී කාලයේ රථවාහන නැවැත්වීමට සංඥා කිරීමේදී, අදාල නිලධාරියා රියදුරන්ට මනාව දර්ශනය වන ලෙස ආලෝකය පරාවර්තනය වන ලුමිනස් ජැකට් හා ලුමිනස් අත්වැසුම් පැළඳ සිටීමටත්, රථවාහන නැවැත්විම සඳහා මේ වන විට පොලිස් ස්ථාන වෙත නිකුත්කර ඇති රතු විදුලි පන්දම් හැකිතාක් භාවිතා කිරීමටත් වැඩබලන පොලිස්පතිතුමා විසින් උපදෙස් ලබාදී ඇත.

තවද රාත්‍රී රාජකාරි යොදවන නිලධාරින් එසේ ක්‍රියාකරන්නේ ද යන්න නිරන්තරවම අධීක්ෂණය කරන ලෙසට මූලස්ථාන පොලිස් පරීක්ෂකවරුන්, ස්ථානාධිපතිවරුන් සහ රථවාහන ස්ථානාධිපතිවරුන් වෙත වැඩබලන පොලිස්පතිතුමා විසින් වැඩිදුරටත් උපදෙස් ලබාදී ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**